දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2013 පරීක්ෂණය - 2016 සැප්තැම්බර්
Bachelor of Arts General (External) Degree Part I 2013 Examination - September 2016

# භූවිසා 2.2 - පාරිසරික භූගෝල විද්‍යාව
# GYG 2.2 - Environmental Geography

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. පාරිසරික භූගෝල විද්‍යාව යනු කුමක්දැයි නිර්වචනය කර එහි විෂය ක්ෂේත්‍රය, පරිසර විද්‍යාත්මක සහ පාරිසරික විද්‍යාත්මක මූලධර්ම ඇසුරින් සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

02. ශක්තිය හා පදාර්ථ හුවමාරුවන ආකාරය අනුව පද්ධති විවිධ වේ. මෙය පෘථිවි පද්ධති වර්ග පහක් ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 20)

03. (i) අන්තර් නිවර්තන අභිසරණ කලාපය (Intertropical Convergence Zone - ITCZ) යනු කුමක්දැයි හඳුන්වන්න.
(ලකුණු 05)
(ii) මෝසම් ක්‍රියාවලිය වෙනස් වීමට අන්තර් නිවර්තන අභිසරණ කලාපයේ පිහිටීම බලපාන්නේ කෙසේදැයි ශ්‍රී ලංකාවේ මෝසම් ඍතු දෙක ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 15)

04. ජනතාව ආපදාවකින් ඉවත්කිරීම හෝ ආපදාවක් ජනතාවගෙන් ඉවත්කිරීම ආපදා කළමනාකරණයේ මූලික ක්‍රමෝපායන් දෙකකි. එය කොතෙක් දුරට ඵලදායී වී තිබේදැයි ශ්‍රී ලංකාවේ ජල ගැලීම් පාලන ව්‍යාපෘතියක් ඇසුරින් සාකච්ඡා කරන්න.
(ලකුණු 20)

05. පාංශු පද්ධතිය (Soil System) අර්ථවත් ව දක්වා, එහි තිරසර පැවැත්මට එල්ල වී ඇති අභියෝග පහක් ශ්‍රී ලංකාව ඇසුරින් විභාග කරන්න.
(ලකුණු 20)

06. (I) මානව කාරක පරිසර අර්බුද 5 ක් (Human - Induced Environmental crisis) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

(II) ඔබ විසින් ඉදිරිපත් කරන ලද අර්බුද අතුරින් <u>එකක්</u> තෝරාගෙන, ඊට බලපෑ හේතු සහ එහි සමාජ - ආර්ථික බලපෑම් 4 ක් අගය කරන්න.

(ලකුණු 15)

07. (I) වනාන්තරවලින් ඉටුවන පාරිසරික මෙහෙයන් හතරක් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(II) ශ්‍රී ලංකාවේ වනගහනයේ පැවැත්ම කෙරෙහි ඇති වී ඇති අභියෝග හතරක් පෙන්වා දෙමින් ඒවායේ කළමනාකරණය සඳහා ගෙන ඇති පියවරයන් අගය කරන්න.

(ලකුණු 12)

08. (I) 'වෙරළ' (Coast), අර්ථවත් ව දක්වා එහි සීමාවන් රූප සටහනකින් දක්වන්න.

(ලකුණු 06)

(II) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත පරිසර පද්ධතීන් හි පැවැත්මට එල්ල වී ඇති අභියෝග 7 ක් කෙටියෙන් පෙන්වා දෙමින්, එහි සංරක්ෂණය හා කළමනාකරණයන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සැකෙවින් අගය කරන්න.

(ලකුණු 14)